# ක්‍රෝධ කරන්නා මුහුණදෙන භයානක විපත් හත


රාජසිංහගම තිලකධම්ම හිමි
සිරි නිකේතනාරාමය, හලාදිවෙල
පිළිමතලාව


දිනක් බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණි කොසොල් මහ රජතුමා බුදුරජාණන් වහන්සේගෙන් මෙහෙම ප්‍රශ්නයක් අහනවා. 'භාග්‍යවත් බුදුපියාණන් වහන්ස, මේ ලෝකයේ මිනිසුන්ගේ ජීවිතවලට අහිත පිණිස, දුක් පිණිස පවතින කරුණු කීයක් තිබෙනවාද ?' කියලා. එතනදී බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා 'මහරජතුමනි, මිනිසුන්ගේ ජීවිතවලට අහිත පිණිස, දුක් පිණිස පවතින කරුණු තුණක් තිබෙනවා. ඒවා තමයි ලෝභ, ද්වේෂ, මොහ කියන්නේ ' කියලා. බලන්න මේ කෙලෙස් මුල් තුන කොච්චර නම් භයානක ඒවාද කියලා. හරියට මේවා ගිනි තුනක් වගේ, තියුණු උල් තුනක් වගේ.

කෝපයට පත්වුණ කෙනෙක් ගැන මොහොතක් සිහිකර බලන්න. නැත්නම් ඔබ කෝපයට පත්වුණ වෙලාවක කණ්නාඩියක් ළඟට ගිහින් මුහුණ බලන්න. කුපිතවුණ නාග රාජයකු වගේ ඇස් දිහා මුහුණ දිහා බලන්න බය හිතෙනවා. ඒ විතරක් නොවෙයි කෙනෙක් කෝපයට පත්වුණාම එයා තුළ තිබුණු ලැජ්ජා, භය ආදී ගුණාංග පවා යටපත්වෙලා යන බව බුදුරජාණන් වහන්සේ වදාළා. (නාස්ස හිරි න ඔත්තප්පං) මිනිසකු තුළ තිබෙන්නෙ ඕනකරන වැදගත් ගුණාංග දෙකක් තමයි ලැජ්ජාව හා භය. ඒවට කියනවා දේවධර්ම කියලා. ඒත් ක්‍රෝධයෙන් හිත අපිරිසිදු වුණාම මේ දෙක යටපත් වෙලා යනවා. ඊට පස්සේ එයා තිරිසනෙක් ගාණයි. හොඳ වචන කටින් පිටකරන්නේ නැහැ. (න වාචො හොති ගාරවො) ගෞරවාන්විත වචන වෙනුවට ක්‍රෝධ හරිත පුද්ගලයා තම කටින් පිටකරන්නේ නපුරු, රළු, පරුෂ වචනයි. ඒ විතරක් නොවෙයි කෝපයට පත්වුණු කෙනෙකුට හරි - වැරැද්ද, යහපත - අයහපත තීරණය කරගන්නත් අමාරුයි. (කුදෙද්දා අත්ථං න ජානාති කුදෙද්දා ධම්මං න පස්සති) අර්ථය මොකක්ද? ධර්මය මොක්කද, කියලා තෝරාබේරා ගන්න බැරි වෙනවා. පලුදු වුණ රූලකින් ඉරක් ගැසුවා වගේ තරහ සිතින් ගන්න තීරණය වැරදි තීරණයක්මයි. ක්‍රෝධය කොච්චර භයානක කෙළෙස් මූලයක්ද කියනවා නම් බුදුරජාණන් වහන්සේ වරෙක දේශනා කරනවා සමහර විට කෙනෙක් ක්‍රෝධ සිතින් මුළාවුණාම තමාගේ මව, පියා වුවත් ඝාතනය කරන්න පුළුවන් බව. (කුදෙධ හි පිතරං හන්ති - කුදෙද්දා හන්ති සමාරතං) ක්‍රෝධය නිසා කෙනෙකු මව, පියා ඝාතනය කර ආනන්තරීය පාප කර්මයක් වුවද සිදුකරගත හැකි බව මේ අනුව අපට පෙනෙනවා.

බුදුරජාණන් වහන්සේ ක්‍රෝධයෙහි භයානක කම බොහොම අපූරුවට පෙන්වා වදාළ සූත්‍ර දේශනාවක් තිබෙනවා අංගුත්තර නිකායේ. ඒ තමයි ක්‍රෝධන සූත්‍රය. එහිදී බුදුරජාණන් වහන්සේ වාදාළා මේ විදියට. 'මහණෙනි, මේ ලෝකයේ අනුන්ට වෛරය ක්‍රෝධකම් කරන යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ඉන්නවාද ? ඒ ස්ත්‍රියට හෝ පුරුෂයාට වෛර කිරීමේ ප්‍රතිඵල වශයෙන් පෙරළා මහා භායනක විපාක හතකට මුහුණදෙන්න සිදුවෙන බව. අපි දැන් බලමු මොනවද ඒ කාරණා හත කියලා.

බුදුරජාණන් වහන්සේ වදාළා ක්‍රෝධකරන පුද්ගලයා තමන්ගේ තරහකාරයන් ගැන මේ විදියට හිතනවා කියලා. කොහොමද ? 'අනේ මේ මිනිස්සු අවලස්සන වෙන්න ඕන, දුර්වර්ණ වෙන්න ඕන' කියලා. ඇයි එහෙම හිතන්නෙ. එයා කැමති නැහැ තමන්ගේ තරහකාරයින් ලස්සනට ඉන්නවට. එයා කැමති ඒ ඇත්තෝ අවලස්සන වෙනවාටයි. අවලස්සනට ඉන්නවාටයි. දැන් අද සමාජයේ නැද්ද මේ විදියට හිතන අය. තමන්ගේ තරකාරයින්මත් නෙවෙයි, සමහරු ඉන්නවා කවුරු හරි හොඳට හැඳ පැළඳගෙන ලස්සනට යනවා නම් හරියට ඉරිසියා කරනවා. සමහරු ඒ වෙලාවට ගස්සලා අහක බලා ගන්නවා. ඇනුම් පද කියනවා. ඇයි ඒ අය මෙහෙම කරන්නේ. අනුන්ගේ ලස්සන ඉවසගන්න බැරිකමටයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා යම් කෙනෙක් මේ විදියට අනුන්ගේ ලස්සනට වෛර කරමින් ඉරිසියා කරමින්, එයා හදනවා ලස්සනට ඉන්න. එයා හිතනවා අර මිනිස්සු වගේ මාත් ලස්සනට ඉන්න ඕන කියලා. ඉතින් මෙයා මොකද කරන්නෙ (සුනහාතො - සුවිලිත්තො) හොඳට නාලා, කොණ්ඩේ පීරලා, ආලේප වර්ග ගාලා, මල් දම් අබරණවලින් සැරසිලා, ලස්සන වෙන්න හදනවා. ලස්සන වෙනවාද ? නෑ. ඇයි ලස්සන නොවන්නේ ? බාහිරින් සැරසුනාට මෙයාගේ ලස්සන වෙන්න ඕනතැන ලස්සන වෙලා නෑ. ඇතුළත වෛරය, ක්‍රෝධය පිරිලා. අනුන්ගේ ලස්සන දරාගෙන ඉන්න බෑ. ඉතින් සිත ඇතුළේ වෛරය, ක්‍රෝධය ආදී අපිරිසිදු දේවල් තියාගෙන බාහිර ශරීරයේ කොච්චර ලස්සන කරන්න හැදුවත් කවදාවත් කෙනෙක් ලස්සන වෙන්නෙ නෑ. (දොසො විරූපකාරකො) ද්වේෂය කියන්නේ විරූපී වෙන්න හේතුවක් බව බුදුරජාණන් වහන්සේ වදාළා. ක්‍රෝධය නිසා ලේ ධාතුව අපිරිසිඳු වෙලා පුද්ගලයා විරූපී තත්ත්වයට පත්වෙනවා. අවලස්සන වෙනවා. ඉතින් මේක තමයි බුදුරජාණන් වහන්සේ වදාළ ක්‍රෝධ කරන්නාට අත්විඳින්නට වන පළමුවැනි විපාකය.

දෙවැනි කාරණය විදියට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් තමාගේ තරහකාරයන් ගැන මේ විදියට කල්පනා කරනවාය කියලා. කොහොමද ? 'අනේ මේ මිනිසුන් දුක සේම නියන්න ඕන. මගේ තරහකාරයන්ට සුවදායක නින්දක් නම් ලැබෙන්න එපා' කියලා. ඇයි එහෙම හිතන්නෙ මෙයා කැමති නැහැ තමන්ගේ තරහකාරයින් සැනසිල්ලේ නිදාගන්නවට. ඉතින් මෙයා මොකද කරන්නේ ඒ මිනිසුන්ට නිදාගන්න බැරි වන විදියේ මොකක් හරි ගැටලුවක් ඇති කරනවා. නැත්නම් කේලමක් කියලා ඒ අයගේ සිත්වල සැකය ඇති කරවා ඒ මිනිසුන්ට සුවසේ නිදාගන්න බැරිවෙන තත්ත්වයක් ඇතිකරවනවා. මෙහෙම අනුන්ගේ නින්දට වෛර කර බාධා කර මෙයා හදනවා සැනසිල්ලේ නිදාගන්න. කොහොම ඇඳකද මෙයා නිදාගන්න හදන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා පලස් අතුරපු, එළු ලොම් අතුරපු, උඩුවියන් සහිත, සුවපහසු කොට්ට, මෙට්ට ඇතිරිලි සහිත යහනාවකයි මෙයා නිදියන්න හදන්නේ. හැබැයි නින්ද යනවද ? මෙයාට. නෑ. ඇඳ කොච්චර සුවපහසු වුණත් හිත ඇතුළේ තරහ, වෛරය පිරිලා. ඇඳට ගිය ගමන් තරහකාරයින් මතක් වෙනවා. හිත ගිනි ගන්නවා. ඇඟපත රත්වෙනවා. 'අනේ ඔය මිනිසු කොහොමද විනාශ කරන්නේ' කියලා සැලසුම් කරනවා. නින්ද යන්නෙම නැහැ. ඇහැ පියවෙනකොට තිගැස්සී ඇහැරෙනවා. බියකරු සිහින පේන්න ගන්නවා. බලන්න ක්‍රෝධයෙහි තිබෙන භයානකකම කොච්චරද කියලා. ක්‍රෝධය නිසා සැනසිල්ලේ ලබන නින්ද අහිමිවෙලා යනවා.

බුදුරජාණන් වහන්සේ වදාළා මේක තමයි ක්‍රෝධ කරන්නාට අත්විඳින්න වන දෙවැනි විපාකය කියලා.

බුදුරජාණන් වහන්සේ ඊළඟට දේශනා කරනවා ක්‍රෝධ කරන කෙනා තමන්ගේ සතුරන් ගැන මේ විදියට කැමැත්තක් ඇති කරගන්නවාය කියලා. 'අනේ මේ මිනිසුන්ට දැන උගත්කම් ඇතිවෙන්න එපා' කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ඒකට හේතුව 'මහණෙනි, මෙයා කැමති නැහැ තමන්ගේ සතුරන් ඉගෙනගන්නවට. තමන්ගේ තරහකාරයන් දැන ඉගෙන ගෙන සමාජයේ ඉදිරියට යනවට මෙයා කැමති නැහැ. ඇතැම් අය ඉන්නවා තමන්ගේ ඥාති දරුවෙක් ඉගෙන ගන්නවට තරහයි. ගමේ ළමයෙක් අල්ලපු ගෙදර දරුවෙක් ඉගෙනගන්නවට තරහයි. නොයෙකුත් බාධාකම් ඇතිකරවලා අකුල් හෙලා ඒ අයගේ ඉගෙනීමට බාධා ඇති කරවනවා. ඉතින් මෙහෙම අයට මොකද වෙන්නේ ? බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා එවැනි අය වෛරය නැමැති වැරැදි දේ අල්ලා ගෙන බුද්ධහීන අර්ථය, අනර්ථය තෝරා බේරාගන්න බැරි පුද්ගලයන් බවට පත්වෙනවා කියලා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා





**Wonderland Cafe**

**ඉදිආප්ප (String Hoppers)**

**සුදු / රතු සහල් පිටි ඉදිආප්ප**

**කුරක්කන් සහ රතු සහල් පිටි ඉදිආප්ප**

**උත්සව සහ ප්‍රියසම්භාෂන සඳහා***

**White / Red String Hoppers for Bulk Orders***

***Catering for Parties, Functions & Special Occasions* ***

- Impress your guests with a memorable treat...
- Exquisite Sri Lankan cuisine with unforgettable tastes
- We offer a wide range of Rice & Curries to select from.

**Visit Wonderland Cafe web site (party catering page) for a selection of fabulous rice & curries.**

* Conditions Apply and Minimum Quantities Apply

**Phone: (03) 9701 0005 or 0416 457 359**

**Wonderland Cafe, 4/52 Outlook Drive, Dandenong North, Vic 3175** (Melway Ref. 81 E9)

**www.wonderlandcafe.com.au**